*සැ. යු.* 2011.04.15 දින පළ වූ අංක 1702 දරන *ගැසට් පත්‍රයේ* I - III කොටස පළ නොවීය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,703 - 2011 අප්‍රේල් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2011.04.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... | 142 |
| විවිධ දැන්වීම් ... ... ... | 142 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලුම දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අප්‍රේල් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# නොතාරිස් ලැයිස්තු

## නොතාරිස් ආඥාපනත (107 වැනි අධිකාරය)

නොතාරිස් ආඥා පනත (107 වැනි අධිකාරය) 11 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

01. බදුල්ල, පිංඅරාව, පීලිපොතගම පාර, අංක 50 හි පදිංචි, මහන්තේ ආරච්චිලාගේ ධම්මිකා මල්කාන්ති මෙනෙවිය, බදුල්ල අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
02. පිළියන්දල, පලිගෙදර, වැලි පාර, අංක 149/2' ඩී හි පදිංචි, හේමන්ත රසික ගාර්දිහේවා මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
03. දෙහිවල, කළුබෝවිල, මංගල පාර, අංක 53/1' ඒ හි පදිංචි, මල්කා සම්මානි වික්‍රමසේකර රාජපක්ෂ විමලගුණරත්න මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
04. කෝට්ටේ, ඇතුල් කෝට්ටේ, පෙරේරා මාවත, අංක 16 හි පදිංචි, දිනේෂ් විදානපතිරණ මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
05. කෝපායි, තිරුනෙල්වේලි, ග්‍රාම සංවර්ධන අධිකාරිය, අංක 112 හි පදිංචි, නඩරාජ අයිසර් සතාසිව අයියර් මහතා, යාපනය අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
06. කුරුණෑගල, මල්කඩුවාව රවුම් පාර, "ආනන්ද" හි පදිංචි, සමන්ති චතුරිකා හෙන්නායක මෙනෙවිය, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්.

2011 මාර්තු මස 15 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ.

04-600

## නොතාරිස් ආඥාපනත (107 වැනි අධිකාරය)

නොතාරිස් ආඥාපනත (107 වැනි අධිකාරය) 03 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

01. මහනුවර, පේරාදෙනිය පාර, අංක 490/1 හි පදිංචි, අලුත්ගේ කුමුදිනි නිල්මිණී ධර්මදාස මහත්මිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
02. අහුන්ගල්ල, එගොඩමුල්ල, ගාලු පාර හි පදිංචි, මද්දගේ රෝහණ සම්පත් මහතා, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
03. මීගමුව, කොළඹ පාර, අංක 400/7 හි පදිංචි, ඩයනා වීරසිංහ මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
04. ආඬිඅම්බලම, ජයකොඩි මාවත, අංක 207/5 හි පදිංචි, රෝසන් මරියෝ මඩවල මහතා, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
05. දෙහිවල, රොබට් පෙදෙස, අංක 16ඒ හි පදිංචි, තරින්දි මල්මී දිසානායක මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
06. කෝට්ටේ, බැද්දාගන, දූව පාර, අංක 196 හි පදිංචි, තාෂණා උදයන්ති රත්නායක මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,
07. කොළඹ 06, හැව්ලොක් පාර, එඩ්වඩ් පෙදෙස, අංක 291/16 හි පදිංචි, මාරඹේ වීරසිංහ මුදියන්සේ රාළහාමිලාගේ තිරුණි ඔපේකා කුමාරිහාමි මාරඹේ මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්.

2011 මාර්තු මස 15 වැනි දින,
කොළඹ.
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

04-601

# විවිධ දැන්වීම්

## ජයවික්‍රම පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නිශාන්ත මුතුහෙට්ටිගම වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ජයවික්‍රම පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ජයවික්‍රම පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) පදනමේ සාමාජිකයන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම ;
(ආ) පදනමේ සාමාජිකයන්ගේ සංස්කෘතික අවශ්‍යතා සපුරාලීම ;
(ඇ) පදනමේ සාමාජිකයන් තුළ අන්‍යෝන්‍යාධාරය පිළිබඳ හැඟීම් වර්ධනය කිරීම, ;

යනාදිය වේ.

නිශාන්ත මුතුහෙට්ටිගම,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගාල්ල දිස්ත්‍රික්කය.

04-610

**තාක්ෂණ සහ සමාජ සේවා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

කනක හේරත් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "තාක්ෂණ සහ සමාජ සේවා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී මධ්‍යස්ථානය සංස්ථාගත කිරීමයි :-

1. සංසදය පිහිටුවා ඒ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීම ;
2. තොරතුරු ජාලය පිහිටුවා පවත්වාගෙන යාම ;

යනාදිය වේ.

කනක හේරත්
කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

04-613

---

**ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම**

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් (කොළඹදී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේදීය.

එහි ලියාපදිංචි කාර්යාලය මීතිරිගල 'රන්වල' හත්දූව වතුයායේ පිහිටි නෙල්නා ෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV2824) හි කාරණය සම්බන්ධයෙනි.

නඩු අංකය : එච්. සී (සිවිල්) 17/2011/සීඕ.
ස්වභාවය : ගණන් බේරා වසාදැමීම

සහ

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ ප්‍රකාරව අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීම පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

ගෝල්ඩ් කොයින් ෆීඩ් මිල්ස් (ලංකා) ලිමිටඩ්,
අංක 205, විස්ට්වයික් පාර,
කොළඹ 15.

**පෙත්සම්කරු**

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹදී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ, මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 15, විස්ට්වයික් පාර, අංක 205 හි පිහිටි ගෝල්ඩ් කොයින් ෆීඩ් මිල්ස් (ලංකා) ලිමිටඩ් සමාගම විසින් 2011 මාර්තු මස 15 දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2011 ජුනි මස 14 දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අත්සන් කලේ : එෆ්. ජේ. සහ ජී. ද සේරම්,
නීතිඥවරු,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

*සටහන* .-එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතුය. නැතහොත්, තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2011 ජුනි මස 13 දින පස්වරු 6.00 ට පෙර බාරදිය යුතුය. නැතහොත් තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතුය.

04-653

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.